# කාර්යය සාධන වාර්තාව - 2019

නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු
අමාත්‍යාංශය

දෙවන මහල
"සෙත්සිරිපාය", බත්තරමුල්ල

# පිටු පෙළගැස්ම

## නිවාස හා ඉදිකිරීම් අංශය


| <u>පරිච්ඡේදය</u> | <u>පිටු අංකය</u> |
|---|---|
| පරිච්ඡේදය 1 | |
| 1.1 හැඳින්වීම | 02 |
| 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 03 |
| 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 04 |
| 1.4 අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ | 05 |
| 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන් | 06 - 09 |
| 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සහ අරමුදල් | 10 -13 |
| 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති | 14 |
| පරිච්ඡේදය 2- 2019 ප්‍රගතිය සහ 2020 ඉදිරි දැක්ම | 15- 24 |
| පරිච්ඡේදය 3 – මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 25- 32 |
| පරිච්ඡේදය 4 – කාර්ය සාධන දර්ශක | 33 |
| පරිච්ඡේදය 5 – තිරසර සංවර්ධන අරමුණු | 34 |
| පරිච්ඡේදය 6 – මානව සම්පත් පැතිකඩ | 35-37 |
| පරිච්ඡේදය 7 – අනුකූලතා වාර්තාව | 38-42 |

## 1.1 හැඳින්වීම

2019 වර්ෂය තුල නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත්ව ක්‍රියාත්මක වු නිවාස හා ඉදිකිරීම් අංශය 2019-12-10 දින සිට නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතට පත්ව ඇත. දැනට එය නිවාස පහසුකම් අංශය වශයෙන් ක්‍රියාත්මක වේ.

තවද නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අයත්ව තිබු සංස්කෘතික කටයුතු අංශය 2019-12-10 දින සිට බුද්ධශාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු අංශය ලෙස දැනට ක්‍රියාත්මක වේ.

එසේ වුවද 2019 වර්ෂය තුල වැඩිම කාලසීමාවක් නිවාස හා ඉදිකිරීම් අංශයත් , සංස්කෘතික කටයුතු අංශයත් නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ලෙස ක්‍රියාත්මක වී ඒ අනුව වර්ෂ අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇති බැවින් එම අංශ 2ටම අදාල කාර්යය සාධන වාර්තා වෙන වෙනම නමුත් එක් වාර්තාවක් ලෙස සකස් කොට මේ සමග ඉදිරිපත් කෙරේ.

2019 වර්ෂයේදි නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිවාස හා ඉදිකිරීම් අංශය වෙත වෙන්ව තිබු සමස්ත ප්‍රතිපාදනය රු.මි.11389 කි. ඉන් රු.මි.10946 ක් ප්‍රාග්ධන යෙදවුම් සඳහා වෙන් කොට තිබිණි. වර්ෂය තුළ පැවැති දේශපාලනික ව්‍යාකූලතා මධ්‍යයේ වුවද අමාත්‍යාංශයේ මුල්‍ය ප්‍රගතිය 85% ක මට්ටමකට ඔසවා තැබීමට හැකිවීම අමාත්‍යාංශයක් ලෙස අප ලද භාග්‍යයකි.

ජාතික නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ආදර්ශ ගම්මාන 905 ක් වර්ෂය තුල ආරම්භ කරමින් වර්ෂය අවසානය වන විට ආරම්භ කර ඇති සමුච්චිත ආදර්ශ ගම්මාන සංඛ්‍යාව 1415 ක් බවට පත්කර ගැනීමට හැකි විය.

දිළිඳු පවුල් සඳහා ආධාර පදනමින් මෙන්ම අඩු ආදායම්ලාභීන් සඳහා සහන ණය පදනමින් මුල්‍ය ආධාර මෙන්ම තාක්ෂණික මගපෙන්වීම සලසමින් ක්‍රියාත්මක කළ නිවාස වැඩසටහන් විවිධ ජන කොටස් වල අවශ්‍යතා පරිදි තවදුරටත් සුඛනම්‍ය ලෙස සකසා තිබේ. නිවසක් තැනීමට බිම් කොටසක් නොමැති ප්‍රජාව වෙත ආදර්ශ ගම්මානයක බිම් කොටසක්ද සමග නිවසක උරුමය තහවුරු කරදෙන අතර බිම් කොටසක අයිතිවාසිකම සහිත අයවලුන් සඳහා විසිරි ණය සහ විසිරි ආධාර වැඩසටහන් රැසක් 2019 වසර තුළද ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන ඇගයීමට ලක් කරමින් ඉන්දියානු රජය විසින් තවත් රු.මි.600 ක් ජාතික නිවාස වැඩසටහන තුළින් ආදර්ශ ගම්මාන වැඩපිළිවෙලට එක් කරනු ලැබීම වර්ෂය තුළ අප ලද ජයග්‍රහණයකි.

ඉදිකිරීම් අංශයේ පුහුණු ශ්‍රමික හිඟය සඳහා විසඳුම් සලසමින් “ශිල්ප සවිය” ජාතික වැඩසටහන සාර්ථක ලෙස දියත් කළ වසරක් ලෙසත් 2019 වර්ෂය වැදගත්ය. එමෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රය නගාසිටුවීම සඳහා නව නීති සම්පාදනයට පියවර එසවු වසරක් ලෙස 2019 වර්ෂය කැපී පෙනේ. ඉදිකිරීම් කර්මාන්තයේ සුමට උන්නතිය උදෙසා අංශ රැසකින් කටයුතු කරමින් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වු වසරක් ලෙස ද මෙම වර්ෂය වැදගත්ය.

## 1.2 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර (නිවාස හා ඉදිකිරීම් අංශය)

### දැක්ම

"තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්"

### මෙහෙවර

ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින් වෘත්තීයවේදීන් හා ශ්‍රම බලකාය හැකියාවන් හා සම්පත් වලින් සන්නද්ධ කරමින් සැලසුම් ගත පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීම හා ප්‍රජා සහභාගිත්වයෙන් මූලික පහසුකම් සහිත ජනාවාස බිහිකිරීම හරහා අඩු ආදායම්ලාභී ජනතාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අතින් සවිබල ගැන්වීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම.

### නිවාස හා ඉදිකිරීම් අංශයේ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා
ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාළ ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

# 1.3 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් (නිවාස හා ඉදිකිරීම් අංශය)

## නිවාස අංශය

1. අඩු ආදායම්ලාභී සහ විශේෂ ප්‍රජා කණ්ඩායම් ද ඇතුළුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මුල්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම, පවරා ගැනීම හා බැහැර කිරීම සම්බන්ධ කටයුතු
3. නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.


## තාක්ෂණ අංශය

1. ඉදිකිරීම් විෂයට අදාල ව ප්‍රතිපත්ති නීතිරීති සම්පාදනය හා පසු විපරම් කිරීම.
2. ඉදිකිරීම් කර්මාන්තය පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. අමාත්‍යාංශය යටතේ වන රජයේ දෙපාර්තමේන්තු, ඉදිකිරීම් සම්බන්ධ අධිකාරියෙහි කටයුතු නියාමනය හා මග පෙන්වීම.

## ඉදිකිරීම් අංශය

1. අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් ආයතන සම්බන්ධිකරණය සහ ප්‍රගතිය නියාමනය කිරීම
2. අමාත්‍යාංශය යටතේ ඇති තාක්ෂණිකමය නොවන ආයතන සඳහා ඉදිකිරීම් කටයුතු වලදී තාක්ෂණික මගපෙන්වීම් ලබාදීම.

# 1.4 - අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ (නිවාස හා ඉදිකිරීම් අංශය)




නියෝජ්‍ය අධ්‍යක්ෂ **- නි. අ.**
පරිපාලන නිලධාරි - පනි
තාක්ෂණ නිලධාරි- තා.නි

සහකාර ලේකම්- ස.ලේ
තොරතුරු තාක්ෂණ නිලධාරි -තො.තා.නි
රියදුරු -රි

සහකාර අධ්‍යක්ෂ - ස.අ
භාෂා පරිවර්තක නිලධාරි - භා.පරි.
කාර්යාල කාර්යය සහයක- කා.කා.ස

ගණකාධිකාරි -ගණ
සංවර්ධන නිලධාරි - සං.නි

නීති නිලධාරි - නි.නි
රාජ්‍ය කළමනාකරණ නිලධාරි - රා.කළ.නි-

ප්‍රමාණ සමීක්ෂක - ප්‍ර.ස

# 1.5 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ සහ විෂය ක්ෂේත්‍රයන් (නිවාස හා ඉදිකිරීම් අංශය)

## 1.5.1 පාලන අංශය

නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මහජන සුභසිද්ධිය පිණිස සිදු කරනු ලබන විවිධ කර්තව්‍යයන් සංවිධානය කිරීම, අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහාය ලබාදීම, ඒ සඳහා අවශ්‍ය වැඩ පරිසරය සකස් කිරීම, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම ආදිය පාලන අංශය මගින් සිදු කරනු ලබයි.

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ ආයතනික කටයුතු
2. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු
3. අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු
4. අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන වල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම පරිපාලන කටයුතු.
5. අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය සම්බන්ධ කටයුතු.
6. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම.
7. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
8. ඵලදායිතා ක්‍රියාකාරකම් සිදුකිරීම.
9. අමාත්‍යාංශයේ කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.
10. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුහුණු සැසි පැවැත්වීම.
11. අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල කාර්යය සාධන වාර්තා සම්බන්ධ කටයුතු.

## 1.5.2 සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම් කළ පරිදි ප්‍රගතිය ලඟාකර ගැනීම සඳහා මෙහෙයවීම අංශයේ ප්‍රධාන කාර්යය භාරය වේ.

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීමද ඊට අයත්ය. තවද, නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් පසු විපරම් කිරීම හා ඇගයීම් කිරීමත් සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අදාලව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මාසිකව හා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇගයීම.
3. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
4. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වල ව්‍යාපෘති යෝජනා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
5. ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.
6. අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාල අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම.
7. අමාත්‍යාංශ වාර්ෂික ප්‍රගති වාර්තාව හා කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීම.
8. ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම හා පසුවිපරම් කිරීම.

### 1.5.3 නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලඟා කර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මඟපෙන්වීම. මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

#### නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

**1. ප්‍රතිපත්ති සම්පාදනය**

- නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
- නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සකස් කිරීම.
- නිවාස ක්ෂේත්‍රයට අදාල පනත් සංශෝධනය.
- නිවාස ක්ෂේත්‍රයට අදාල වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.

.

**2. ඉඩම් රාජකාරි**

- නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම / පවරා ගැනීම සම්බන්ධ කටයුතු.
- නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට පවරා දීම.

**3. නිවාස සංවර්ධනය**

- දීප ව්‍යාප්තව නිවාස ඉදිකිරීමේ වැඩසටහන් හා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- සහභාගිත්ව ක්‍රමවේදය නිවාස ණය / ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය (Public Private Patnership) යටතේ නිවාස සංවර්ධනය
- අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව නගා සිටුවීම.
- මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම හා සහාධිපත්‍ය දේපළ කළමනාකරණය.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමග නිවාස ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මහජනතාවගෙන් ඉදිරිපත් වන නිවාස ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.

**4. වෙනත් රාජකාරි**

- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.
- ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම.

### 1.5.4 තාක්ෂණ අංශය

#### 1.5.4.1 ඉංජිනේරු සේවා අංශය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සාධාරණ හා දැරිය හැකි මිල ගණන් නියම කිරීම තුළින් සමස්ත ඉදිකිරීම් කර්මාන්තයේ, මුළු ඉදිකිරීම් පිරිවැය පාලනය කිරීමත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විනිවිද භාවයකින් යුතුව සාධාරණ මිල ගණන් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට සහාය වීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

#### ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජයේ ආයතන වල ඉදිකිරීම් සම්බන්ධ ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතිය ලබාදීම.
2. කොන්ත්‍රාත් විචලනයන් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම.
3. අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටු සම්බන්ධව කටයුතු කිරීම.
4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම.
5. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල මිල ගණන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

### 1.5.5 ඉදිකිරීම් අංශය

#### 1.5.5.1 තාක්ෂණ අංශය

ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීමට, පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් බිහි කිරීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මෙහෙයවීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල පනත් කෙටුම්පත් , පනත් සම්බන්ධ කටයුතු
3. තාක්ෂණ අංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තය නියාමනය සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
4. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සුදානම් කිරීම සඳහා කටයුතු කිරීම.
5. වෘත්තීයවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.
6. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

#### 1.5.5.2 නාගරික ජනාවාස සංවර්ධන අංශය

ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශයන්හි වාසය කරනු ලබන අඩු ආදායම්ලාභී ජනතාවට හා අනෙකුත් ජනතාවට අවශ්‍ය පරිදි පදිංචි වීමට හැකියාව පවතින, පහසුකම්වලින් සමන්විත නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් මෙහෙයවීම හා නාගරික ජනාවාස සංවර්ධනය කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**නාගරික ජනාවාස අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. නාගරික ජනාවාස ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා තාක්ෂණික මඟපෙන්වීම.
2. නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

### 1.5.6 ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති යම් කාර්යයන් ද ඉටු කරයි.
ඉහත නීති මඟින් දක්වා ඇති ප්‍රධාන අරමුණ වන කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම, රජයට පවරා ගත් නිවාසවල අයිතිකරුවන්ට වන්දි ලබා දීම වැනි අරමුණු සඳහා මෙම අංශය ක්‍රියා කරයි.

**ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම.
2. රජයට පවරාගත් නිවාස වල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
3. පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති කොටස් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු නිරාකරණය කිරීම.

### 1.5.7 මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

**මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්**

1. කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය කළමනාකරණ පද්ධතියක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කිරීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.

3. මූල්‍ය කළමනාකරණ, මූල්‍ය සැලසුම්, අයවැයකරණය, වත්කම් කළමනාකරණය හා මිලදී ගැනීම්, කළමනාකරණය සම්බන්ධයෙන් අමාත්‍යාංශයට හා යටතේ ඇති ආයතන සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබාදීම.

4. මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගත් හැකි ආකාරයට මූල්‍ය සම්පත් භාණ්ඩාගාරයෙන් ලබාගෙන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන අතර බෙදා හැරීම.

5. අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කිරීම පෙරදැරිකොට එම ආයතන. සමග සාමූහිකව වාර්ෂික අයවැය වාර්තා පිළියෙල කිරීම හා වර්ෂය පුරා අයවැය පාලන කටයුතු කිරීම.

6. වාර්ෂික විසර්ජන පනත් මගින් අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට වෙන් කරන මුදල් වියදම් කිරීමේදී නියමිත පරිදි වාර්තා කිරීම හා මාසිකව,වාර්ෂිකව මූල්‍ය වාර්තා අදාල ආයතන වලට ඉදිරිපත් කිරීම.

## 1.5.8 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති / අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කර ගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගී වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මග පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් සහායවීම.

### අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණයක් ඇති කිරීම.

2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.

3. විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවම කර ගැනීමට සහාය වීම.

4. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම

# 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සහ අරමුදල් (නිවාස හා ඉදිකිරීම් අංශය)

## 1.6.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකරදීමේ අරමුණින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ. අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා උනන්දු කරවීම, පහසුකම් සැලසීම, සහ සම්බන්ධිකරණය කිරීම තුළින් ආර්ථික සමෘද්ධිය ළගා කරදීම සඳහා 1979 අංක 17 දරණ "ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත" මගින් ස්ථාපිත කරන ලද අතර වර්තමානයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික්ක 25 තුළම කාර්යාල පිහිටුවා ඇත. කොළඹ නගරයේ ප්‍රධාන කාර්යාලයට අමතරව උප කාර්යාල 02 ක් පිහිටුවා ඇත.

## 1.6.2 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

තිරසාර නාගරික ජනාවාස තුළ සාඩම්බර ජීවිතයක් සහතික කිරීමේ අරමුණින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබාදීම, ප්‍රජාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම ආදී කාර්යයන් සඳහා 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත ස්ථාපිත කරන ලදි.

## 1.6.3 සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය දේපල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුභසාධනයට ගැළපෙන පරිදි ඉදිකිරීම හා එම දේපල ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණ සංස්ථා පිහිටුවා දේපල නඩත්තු කරවීම යන කාර්යයන් නියාමනය සඳහා 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධිත) පනත මගින් නියාමන අධිකාරියක් ලෙස සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කරණ ලදි. තවද 1982 අංක 45, 2003 අංක 39 යන පනත් වලින් සංශෝධිත බද්ධ නිවාස අයිතිකම් පනතේ නියමයන් නියාමනය කිරීම මෙහි මූලික අරමුණ වේ.

## 1.6.4 ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම

ශ්‍රී ලංකාවේ දේපල සංවර්ධන වෙළඳපොල තුළ ප්‍රමුඛතම දේපළ සංවර්ධන සමාගම බවට පත්වීමේ අරමුණින් 1982 අංක 17 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත.(ලි.ප.අංක - PV 17667) පසුව එය 2007 අංක 07 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව නැවත ලියාපදංචි කිරීම සිදු කර ඇත. පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවය පෙරදැරි කරගත් මෙම සමාගම වර්තමානය වන විට නිවාස ක්ෂේත්‍රයෙහි කැපී පෙනෙන වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කරමින් සිටී.

### 1.6.5 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1849 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලෙසින් ආරම්භ වු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී “ඒ” කාණ්ඩයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබූ අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් අනතුරුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එකම අධිකාරි ආයතනය සහ උපදේශක ආයතනය ලෙස සළකනු ලැබේ.

ප්‍රධාන ඉංජිනේරු කාර්යාල 07 ක් මඟින් දිවයින පුරා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් වස් විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබේ.

මෙම ආයතනය ISO 9001/2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.

### 1.6.6 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ලෝහ හා වඩු කර්මාන්ත ආශ්‍රිත වැඩ, භාණ්ඩ හා සේවා සැපයීමේ කාර්යයන් සහ යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා වැඩබල නිෂ්පාදන සහ වැඩ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබාදීමේ අරමුණින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.
මෙම ආයතනය ISO 9001/2008 තත්ත්ව සහතිකයෙන් පිදුම් ලබා ඇත.

### 1.6.7 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් සඳහා අධිකාරිය කටයුතු කරනු ලැබේ.

### 1.6.8 ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශක සේවා ලබාදීම, ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය, පෙරසවි/පෙරදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබාදීම මෙන්ම පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.

2009 වසරේ සිට ISO 9001:2000 තත්ත්ව සහතිකයෙන් හා ISO 14001:2004 පරිසර කළමනාකරණ සහතිකයෙන්ද පිදුම් ලබා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

## 1.6.9 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

රාජ්‍ය ආයතන සඳහා පස් තැලීමේ යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 වසරේ දී පිහිටුවන ලදි. 2011 වසරේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශය ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඒ යටතට ගනු ලැබූ අතර 2016 වසරේ ජනවාරි මාසයේ දී නැවත වරක් අමාත්‍යමණ්ඩල තීරණයක් මඟින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේම කළමනාකරණ මණ්ඩලයක් මඟින් ක්‍රියාත්මක වේ.

වනජීවී, සත්වෝද්‍යාන, වාරිමාර්ග, වෙරළ සංරක්ෂණ සහ දුම්රිය ආදී දෙපාර්තමේන්තු විසින් ප්‍රදානය කරනු ලබන විශේෂිත කොන්ත්‍රාත් මඟින් මෙම ආයතනය ඉදිරියට යමින් සිටියි. මුදුණ වෘත්තිකයින්, පුහුණු සේවකයන් සහ කම්කරු මට්ටමේ සේවකයන් 609 කින් සැදුම්ලත් කාර්යය මණ්ඩලයකින් සමන්විතය. තවද ආයතනය බර යන්ත්‍රෝපකරණ ඇණියක් සහ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා සේවය සපයන ඩිපෝ පද්ධතියකින් මෙන්ම දිවයිනේ සෑම පළාතකම පිහිටි සියළු පහසුකම් වලින් සමන්විත යාන්ත්‍රික වැඩහල් වලින් යුක්තය.

## 1.6.10 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 ඔක්තෝම්බර් 01 වන දින ඉංජිනේරු සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලද අතර, මේ වන විට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රධාන පෙළේ ඉංජිනේරු ආයතනයක් ලෙස පාලම්, මාර්ග, ගොඩනැගිලි, උමං, වාරි මාර්ග හා ජල සම්පාදන යෝජනා ක්‍රම යනාදිය සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ඉදිකිරීම තුළින් මෙරට යටිතල පහසුකම් සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයන අතරම පාලම් ඉදිකිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනයක් ද වේ. එසේම උමං ඉදිකිරීමට හැකියාවක් ඇති එකම ශ්‍රී ලාංකික ආයතනය ද මෙම සංස්ථාවයි.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් මෙම සංස්ථාව C1 ශ්‍රේණියේ ඉදිකිරීම් ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇති අතර, එම ආයතනය මගින් පිරිනමන ලද ඉදිකිරීම් කාර්යය සාධනය පිළිබඳ සම්මාන ද දිනා ඇත.

ISO 9001-2008 තත්ත්ව සහතිකයද හිමි කර ඇති මෙම සංස්ථාව ඉදිකිරීම් නියමිත ප්‍රමිතියටම ගෙන සිදු කරනු ලබයි.

ඉංජිනේරුමය කාර්යයන් සඳහා කොන්ක්‍රීට් පාලම්, බාල්ක, විදුලිකණු,සහ අනෙකුත් සියලුම පෙරසවි (පෙරැදි) කොන්ක්‍රීට් නිෂ්පාදන කරනු ලබයි. මීට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම මාර්ග සංඥා පද්ධති නඩත්තු කිරීම සහ නව පද්ධති සවි කිරීම ද සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

## 1.6.11 සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථා සමාගම

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කරන ලදි. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ 100% රජය සතු සී/ස වගකීම් සහිත සමාගමක් බවට මෙම සංස්ථාව පත්කරන ලදි. 2007 වර්ෂයේදී සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් විය. නැවත 2010 වර්ෂයේ මාර්තු මාසයේදී 2007 සමාගම් පනතේ අංක 07 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

දිවයින පුරා තරඟකාරී මිලකට ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමේ ප්‍රමුඛයා වෙමින්, ප්‍රජාවගේ විශ්වාසය දිනාගනිමින්, රාජ්‍ය ආයතනයක් වශයෙන් සමාජ වගකීම ඉටුකරනු ලබයි.

## 1.6.12 ජාතික නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

2003 අංක 15 සහ 2011 අංක 45 දරණ පනත් මඟින් සංශෝධිත 1997 අංක 07 දරණ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතෙහි වගන්ති යටතේ වූ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත මෙම බැංකුවේ සාමාන්‍ය කොටස් කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන පුවරුව තුළ ලැයිස්තු ගත කර ඇත.

කොටස් හිමියන්ට ප්‍රතිලාභ උපරිම කිරීම, පාරිභෝගිකයින් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා ඉලක්ක කරමින් සේවා දායකත්වය සැපයීම හා අපේක්ෂාවන් අභිබවා නව්‍ය ලෙස තෘප්තිමත් කිරිම මූලික අරමුණ වේ.

මෙම ආයතනය 2019-12-10 දින සිට මෙම අමාත්‍යාංශයට අයත් නොවේ.

## 1.6.13 මධ්‍ය ආදායම් හා යටිතල පහසුකම් සංවර්ධන කඩිනම් වැඩසටහන

2016 වර්ෂයේදී හඳුන්වාදෙන ලද මෙම වැඩසටහන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුලක් සඳහා සියළු පහසුකම් වලින් සපිරි නිවසක් උරුමකර දීමේ අරමුණින් යුතුව නිවසක් සතු කරගැනීමට මාර්ගයක් නොමැති හා නිවාස නොමැති රාජ්‍ය/පෞද්ගලික අංශයේ වැටුප් ලබන මධ්‍ය ආදායම්ලාභී පවුල් වලට පහසුකම් සැලසීම හා සම්බන්ධිකරණය කිරීම මගින් ඔවුන්ගේ සමාජ පැවැත්ම යහපත් කරලීම මෙන්ම ආර්ථික සමෘද්ධිය ලඟාකරදීම මෙමගින් සිදු කරනු ලබයි.

## 1.7 විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති (නිවාස හා ඉදිකිරීම් අංශය)

ඉන්දියානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති 5 ක් මෙම අමාත්‍යාංශය යටතේ පවතී.

| ව්‍යාපෘතිය | මුල්‍ය වටිනාකම | ව්‍යාපෘති කාලසීමාව | ව්‍යාපෘති අරමුණු |
|---|---|---|---|
| මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතිය (විලච්චිය) | රු.මි.300 | 2018-2019 | අනුරාධපුර දිස්ත්‍රික්කයේ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම ග්‍රාම නිලධාරි වසමේ දිළිදු පවුල් 153 සඳහා නිවාස සැපයීම ඇතුළු මූලික සමාජ යටිතල පහසුකම් සැපයීම |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය I | රු.මි.300 | 2017-2020 | දිළිදු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| දීප ව්‍යාප්ත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2017-2020 | දිළිදු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| දකුණු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය II | රු.මි.300 | 2019-2022 | දිළිදු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |
| උතුරු පළාත් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය | රු.මි.300 | 2019-2022 | දිළිදු පවුල් 600 ක් සඳහා සහභාගිත්ව ප්‍රවේශය මත නිවාස ඉදිකිරීම |

# පරිච්ඡේදය 2
## 2019 ප්‍රගතිය සහ 2020 ඉදිරි දැක්ම (අංශ අනුව)

## 2.1 - පාලන අංශය

❖ **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා 2019 වර්ෂය අවසාන වන විට අනුමත සමස්ත කාර්ය මණ්ඩලය 198 ක් වූ අතර දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණිය සඳහා නව තනතුරු ඇති කිරීම මැයෙන් වූ අ.ම.ප.12/15/42/504/142-viii හා 2017/10/4 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම අමාත්‍යාංශය වෙත අනුමත වූ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය (විශේෂ ශ්‍රේණිය) හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය (විශේෂ ශ්‍රේණිය) තනතුරු 02 සඳහා 2019 වර්ෂයේදි නිලධාරීන් පත් කර එවන ලදි. ඒ සමඟ අමාත්‍යාංශයේ අනුමත සමස්ථ කාර්යය මණ්ඩලය 198 දක්වා වර්ධනය විය.

2018 වර්ෂයේ අවසන් කාර්තුවේ මෙම අමාත්‍යාංශයට අනුමත වූ අධ්‍යක්ෂ (ඉඩම්) තනතුර සඳහා 2019 වර්ෂය තුළ නිලධාරියකු අනුයුක්ත කරගැනීමට හැකිවූ අතර, වසර 02 කට ආසන්න කාලයක් පුරප්පාඩුව පැවති ගණකාධිකාරී තනතුර සඳහා ද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නව බඳවාගැනීම් මඟින් නිලධාරියකු අනුයුක්ත කර ගැනීමට හැකියාව ලැබුණි.

තවද කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා උසස් වීම් හා වෙනත් තනතුරුවලට යාම හේතුවෙන් එම සේවයෙහි පුරප්පාඩු ඇතිවූ අතර අදාල කාලසීමාව තුළ උපාධිධාරී අභ්‍යාසලාභීන් 07 දෙනෙකු පුහුණුව සඳහා අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ගැනීම මත කාර්ය මණ්ඩල අවශ්‍යතා කළමනාකරණය කරගන්නා ලදී.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය මත 2019 වර්ෂයේ කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනකු බඳවා ගැනීමට හැකියාව ලැබුණි. 2019.12.31 වන විට අමාත්‍යාංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 52ක්ව පැවතිණි.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන කරුණුවලට අදාලව 2019.12.31 දින දක්වා වූ කාලසීමාව තුල අමාත්‍ය මණ්ඩල සංදේශ 47ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 12ක් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

තවද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් 2019 වර්ෂය තුළදී පාර්ලිමේන්තු ප්‍රශ්න 12ක් ඉදිරිපත් වී ඇති අතර එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබාදීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී.

❖ **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

මෙම අමාත්‍යාංශයට අදාලව ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන අතර සේවකයින්ගේ ආයතනික ගැටළු සහ වෘත්තීය සමිති ගැටළු සම්බන්ධව පැමිණිලි ඉදිරිපත් වන අවස්ථා ද දක්නට ලැබේ. විශේෂයෙන්ම ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ මහජන පෙත්සම් කාරක සභාව හරහා ද ඉහත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.

මෙම සියලු ඉල්ලීම් සඳහා මැදිහත් වී කටයුතු කිරීමට අමාත්‍යාංශය නොපමාව කටයුතු කර ඇති අතර ආයතනික සහ වෘත්තීය සමිති ගැටළු සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා පවත්වා විඳුම් ලබාදීමට කටයුතු කරනු ලබන අතර ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. මේ අනුව 2019 වර්ෂය තුල මහජන ඉල්ලීම් 8245 ක් ලැබී ඇත.

- ❖ **කාර්යය මණ්ඩල පුහුණු කිරීම හා පුහුණු වැඩසටහන්**

2019 වර්ෂය තුළ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ විෂය අවබෝධය තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා විවිධ රාජ්‍ය හා අර්ධ රාජ්‍යය පුහුණු ආයතනවලින් පවත්වනු ලබන විෂයානුබද්ධ පුහුණු පාඨමාලා/ වැඩසටහන් සඳහා නිලධාරීන් 80 දෙනෙකු සහභාගී කරවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත.

විදේශීය පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා මෙම අමාත්‍යාංශයේ මාණ්ඩලික ශ්‍රේණියට අයත් නිලධාරීන් 07 දෙනෙකු සහ සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු සහභාගී කරවන ලදී.එසේම පුහුණු අභ්‍යාසලාභීන් 11 දෙනෙකු සඳහා විෂයානුබද්ධ ප්‍රායෝගික පුහුණුව ලබාදීමට අමාත්‍යාංශය මඟින් මෙම වසරේ කටයුතු කර ඇත.

## 2.2 - සැලසුම් අංශය

- ❖ **වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම**

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2019 වර්ෂය සඳහා ද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතන වලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදි.

- ❖ **ප්‍රගති සමාලෝචන රැස්වීම.**

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණයට හා ඇගයීම සඳහා විෂයභාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික නිවාස වැඩසටහන පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් 34 ක් සංවිධානය කරන ලදි. ඉදිකිරීම් ජාතික වැඩසටහන සම්බන්ධයෙන් සංවිධානය කළ ප්‍රගති සමාලෝචන රැස්වීම් ප්‍රමාණය 03 කි. නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් සිදුකිරීමට එමගින් හැකියාව ලැබුණි.

- ❖ **ප්‍රගති වාර්තා සම්බන්ධීකරණය.**

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත මාසිකව ද ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තුමේන්තුව වෙත කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා 04 ක් ද, ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත කාර්තුමය වශයෙන් ලබාදිය යුතු ප්‍රගති වාර්තා 04 ක් ද, අදාල කාලසීමාවන් තුලදී සැපයීමට පියවර ගන්නා ලදි. ඊට අමතරව ආයතන වල ප්‍රතිඵල පාදක ඇගයීම් වාර්තා සම්බන්ධිකරණය සඳහා ද අවශ්‍ය පියවර ගන්නා ලද අතර ජනාධිපති කාර්යය සාධන බලකාය වෙත උතුරු නැගෙනහිර පළාතේ ප්‍රගතිය පිළිබඳ ප්‍රගති වාර්තා 03 ක් ලබාදීම සිදු කරන ලදි.

- ❖ **නව ව්‍යාපෘති යෝජනා**

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබාගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්ට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 12 ක්, භාණ්ඩාගාර අරමුදල් ලබාගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකි විය. එම නව ව්‍යාපෘති යෝජනා මඟින් ඉල්ලා සිටින මුදල රු. මි. 60,000 කි.

- ❖ **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබාගැනීම.**

2019 වර්ෂය අවසාන වන විට මෙම අමාත්‍යාංශය යටතේ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 5 ක් පවතී. එම සියළුම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ ඉන්දියානු රජය විසිනි. 2017 වර්ෂයේදී ඉන්දියානු රජය විසින් එක් දිස්ත්‍රික්කයටකට එක් ආදර්ශ ගම්මානයක් වන පරිදි ආදර්ශ ගම්මාන 25 ක නිවාස ඒකක 600 ක් ඉදිකිරීම සඳහා ලබාදුන් ව්‍යාපාතියේ භෞතික ප්‍රගතිය 60% කට ලඟා වී තිබිණි. ඉන් ආදර්ශ ගම්මාන 4 ක් 2019 වර්ෂය තුල ප්‍රතිලාභී ප්‍රජා අයිතියට පත්කරන ලදි.

දකුණු පළාතේ ආදර්ශ ගම්මාන 25 ක් ආරම්භ කරමින් ඒ ආශ්‍රිතව නිවාස ඒකක 600 ක් ඉදිකිරීම් සඳහා 2017 වර්ෂයේ ලබාදුන් දෙවැනි ව්‍යාපෘතිය මන්දගාමී ලෙස ඉදිරියට යමින් 35% ක ප්‍රගතියක් පෙන්වීමට සමත් විය.

එම ව්‍යාපෘති යුගලයට අමතරව උතුරු පළාතේ ආදර්ශ ගම්මාන 25 ක නිවාස ඒකක 600 ක් සහ දකුණු පළාතේ තවත් ආදර්ශ ගම්මාන 25 ක නිවාස ඒකක 600 ක් බැගින් ඉදිකිරීමට ඉන්දියානු රජය මගින් ලබාදුන් තවත් ව්‍යාපෘති 02 ක වැඩ ආරම්භ කිරීමට 2019 වර්ෂය තුල කටයුතු යොදන ලදි.

මෙම ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම ප්‍රමාද වීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මුහුණ දුන් තාක්ෂණික නිලධාරීන්ගේ හිඟය ආදී කරුණු මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් මන්දගාමී ප්‍රගතියක් ඇතිවීමට හේතු විය.

2018 ජූලි 26 දින ඉදිකිරීම් ආරම්භ කළ විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම පූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතිය ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතාවයන් මත නිසි කලට අවසන් කිරීමට නොහැකි විය. 2019 වර්ෂ අවසානයට එම ව්‍යාපෘතියේ මූලය ප්‍රගතිය රු.මි.28 ක් සහ භෞතික ප්‍රගතිය 30% වශයෙන් සටහන් විය. ඒ අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කොට වෙනත් සුදුසු කොන්ත්‍රාත් කරුවකුට ඉදිකිරීම් කාර්යයන් පවරන ලෙස ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය වෙත නිර්දේශ ලබාදෙන ලදි. ඉන්දියානු රජය විසින් ලබාදුන් ඉහත සියළුම ව්‍යාපෘති එකක් රු.මි.300 බැගින් වටිනාකමකින් යුක්ත වේ.

## 2.3 - නිවාස අංශය

### ❖ මහජන ඉල්ලීම්

2019 වර්ෂය තුළ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් 8245 ක් විෂයානුබද්ධව අදාල ආයතනය වෙත යොමු කොට ලැබෙන පිළිතුරු අනුව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීම සිදුකර ඇත.

තවද "ජනපතිට කියන්න" වැඩසටහන යටතේ අන්තර්ජාලය හරහා දුක්ගැනවිලි ලබාගෙන හැකි ඉක්මනින් අදාළ ආයතන වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබූ අතර මේ සඳහා දුක්ගැනවිලි 390 ක් ආයතන වෙත යොමු කර ඇත.

### ❖ පනත් සංශෝධනය

1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිවාසිකම් පනත සංශෝධනයට අදාල යෝජනාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2017.08.01 දින යොමු කර ඇති අතර 1973 අංක 10 දරණ සභාධිපත්‍ය කළමනාකරණ අදිකාරි පනත සඳහා සාදන ලද රෙගුලාසි 2017.07.05 අංක 2026/25 අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇත.
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ නිරීක්ෂණ 2019.03.29 දිනැතිව නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති අතර මෙම පනත් සංශෝධන සඳහා නව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු බව නිති කෙටුම්පත් සම්පාදක විසින් 2019.12.16 දිනැති ලිපියෙන් දන්වා එවා ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත සංශෝධනය කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩලයක් පත් වී ඇති බැවින් පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු බව නීති කෙටුම්පත් සම්පාදක විසින් දැනුම් දී ඇති බැවින් ඒ සඳහා කටයුතු සිදුකරමින් පවතී.

1972 අංක 07 දරණ ගෙවල් කුලී පනත සංශෝධනය කිරීමේදී නීති කෙටුම්පත් සම්පාදනයට නීති කෙටුම්පත් සම්පාදක වෙත 2018.08.14 දින ලිපි මගින් දන්වා ඇති අතර 2019.02.12 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේදී සාකච්ජාවක් පවත්වන ලදී.

❖ **තොරතුරු දැනගැනීමේ පනත**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව තොරතුරු ලබාගැනීමේ ඉල්ලුම් පත්‍ර 17 න් 10 ක් සඳහා තොරතුරු ලබා දී ඇති අතර අනෙකුත් ඉල්ලුම් පත්‍ර 07 සඳහා අදාළ ආයතනයක් වෙත තොරතුරු ලබාදීම සඳහා යොමු කර ඇති අතර එම ආයතන විසින් අපටද පිටපත් සහිතව ඉල්ලුම්කරුවන් වෙත අදාළ තොරතුරු යොමු කර ඇත.

❖ **ජාතික නිවාස ප්‍රතිපත්ති ප්‍රතිශෝධන කාර්යයන්**

අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2016 ඔක්තොම්බර් 31 වන දින පත් කරන ලද සංස්කාරක මණ්ඩලයක් මගින් ජාතික නිවාස ප්‍රතිපත්තිය සකස් කරන ලදි.

මෙම ජාතික නිවාස ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය සඳහා 2019.01.11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2019.06.23 දින ජාතික නිවාස දින උත්සවයට සමගාමීව ජාතික නිවාස ප්‍රතිපත්තිය (2019 ජනවාරි ප්‍රතිශෝධනය) එළිදක්වන ලදි.

❖ **හිමිකම් හෝ අයිතිය පැවරීම.**

2019 වර්ෂයේ නිවාස/ඉඩම්ලාභීන් 919 කට ඔප්පු ලබාදීම සඳහා අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාදීමට අවශ්‍ය කටයුතු කර අනුමත 8 (1) ලේඛන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත.

❖ **පාර්ලිමේන්තු ප්‍රශ්ණ සඳහා පිළිතුරු සැකසීම**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඇතුළු අදාළ ආයතන සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන පාර්ලිමේන්තු ප්‍රශ්ණ 11 කට පිළිතුරු සකස් කර ඉදිරිපත් කර ඇත.

❖ **අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන්**

අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් 26 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම තීරණවලට අනුව කටයුතු කරමින් පවතී

❖ **නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

**ආදර්ශ ගම්මාන වැඩසටහන** යටතේ ණය හා ආධාර අංශ දෙක යටතේ ආදර්ශ ගම්මන වැඩසටහන් ක්‍රියාත්මකයි.

වර්ෂය තුළ ආදර්ශ ගම්මාන 2562 ක වැඩ ආරම්භ කර ඇත.

ගම්මාන 367 ක් ජනතා අයිතියට පත් කර ඇත. සැමට සෙවණ නිවාස වැඩසටහන යටතේ 2018 වර්ෂය අවසාන වන විට නිවාස 32,228 ක වැඩ ආරම්භ කර ඇත.

**වැලිඔය නිවාස ව්‍යාපෘතිය** යටතේ වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක වන ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා පානීය ජලය ඇතුළු යටිතල පහසුකම් සැපයීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත.

**යෝජිත හන්තාන අදියර II හා අදියර III රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව නිවාස ව්‍යාපෘතිය** සම්බන්ධයෙන් පුද්ගලයන් හතර දෙනෙකු විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය හා ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපති සහ නීතිපතිට එරෙහිව හන්තාන නිවාස ව්‍යාපෘතිය (අදියර 11 අදියර 111) මගින් සිදුවේ යැයි වන චෝදනා

සම්බන්ධයෙන් පරිසර හානිය වලක්වා ගැනීමට 2019 වර්ෂයේ නඩු පවරා ඇති අතර දැනට අභියාචනාධිකරණයේ මෙම නඩුව විභාග වෙමින් පවතී.

❖ සොඳුරු පියස නිවාස ණය වැඩසටහන

මෙම වැඩසටහන සඳහා ණය ලබාදෙන ප්‍රධාන නිර්ණායකයක් වන ගෙබිමේ ප්‍රමාණය වර්ග අඩි 750 ක් දක්වා වූ සීමාව 1500 දක්වා පුළුල් කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව 2019.10.18 දින තෙක් ඉදිරිපත්වූ ණය ඉල්ලුම් පත් අතරින් අනුමත කරන ලද ණය ඉල්ලුම්පත් 28514 ක් බැංකු වෙත ඉදිරිපත් කර 14221 ක් සඳහා ණය ලබා දී ඇත.

❖ වැකන්ද ජාතික නිවාස යෝජනා ක්‍රමය

**මෙම පදිංචිකරුවන් මුහුණ පා ඇති අවදානම් තත්ත්වය හේතුවෙන් එම නිවැසියන් එම ස්ථානයෙන් ඉවත් කිරීම මෙන්ම** මෙම සියළුම පවුල් සඳහා හේනමුල්ල නිවාස යෝජනා ක්‍රමයෙන් නිවාස 150 ක් වෙන් කර තිබුණ ද විදුලි සම්බන්ධතාවය ලැබී නොමැති බැවින් එම කාර්යය සිදු කිරීමට නොහැකි වී ඇත.

මෙම නිවාස යෝජනා ක්‍රමය සඳහා විදුලි සම්බන්ධතාවය ලබා ගැනීම කඩිනමින් කර දෙන ලෙස ඉල්ලා අමාත්‍ය මණ්ඩල සටහනක් 2018.10.16 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

එහෙත් ඒ සඳහා එම වසර තුළ තීරණ නොලැබීම හේතුවෙන් නව අමාත්‍යවරයාගේ අත්සනින් නැවත අමාත්‍ය මණ්ඩල සටහන යොමු කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අත්සන සඳහා ඉදිරිපත් කර ඇත.

❖ සූර්ය පැනල වහල සහිත නිවාස ඉදිකිරිම

සූර්ය පැනල වහල සහිත නිවාස 5000 ඉදිකිරීමේ වැඩසටහන යටතේ සන්පවර් පුද්ගලික සමාගම විසින් විදේශ ආයෝජන ලබා ගෙන නිවාස නොමැති දිළිඳු පවුල් සඳහා නිවාස ඉදිකිරීමට ක්‍රියා කරන මෙම වැඩසටහන යටතේ වර්ග අඩි 650ක නිවාස 5000ක් නොමිලේ ඉදි කර දෙනු ලබන නිවාස ව්‍යාපෘතියේ නිවාස වල වහල කිලෝ වොට් 20 ක් ජනනය කල හැකි සූරිය පැනල වලින් සකස් කෙරේ.ජනනය වන විදුලියෙන් මාසිකව කිලෝ වොට් 90ක් නිවැසියාට ලැබෙන අතර වසර 20කින් නිවසේ අයිතිය හිමිවේ. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අදාල මූලික කටයුතු සිදුකිරීම. මේ සඳහා අදාල අවබෝධතා ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර අදාල ගිවිසුම සඳහා නීතිපතිතුමාගේ නිරීක්ෂණ ලබාගැනීම.

විදුලිබල මණ්ඩලයේ උපදෙස් සමග නිවෙස් හිමියාත්, ඉඩමේ හිමිකරු හා ලං.වි.ම අතර ත්‍රෛපාර්ශවීය ගිවිසුමක් අතිරේක ලිඛිත ලියවිල්ලක් ලෙස සකස්කළ හැකිද යන්න මෙම වැඩසටහන සඳහා ලං.වි.ම සමඟ ගිවිසුම්ගතවිය යුත්තේ කුමන ආයතනද යන්න තීරණය කිරීම.

❖ ලෝක ජනාවාස දිනය

සෑම වසරකම ඔක්තෝබර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය (World Habitat Day) වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කොට තිබේ. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ (UN-Habitat) 26 වන සම්මේලනය 2019 මැයි 27 සිට 31 දක්වා කෙන්යාවේ නයිරෝබි නුවර දී පැවැත්විණි. එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහන ශ්‍රී ලංකා නියෝජිත ආයතනය වන නාගරික සංවර්ධන, ජලසම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජිත පිරිසක් එම සමුළුවට සහභාගී වූහ.

2019 වර්ෂයේ ලෝක ජනාවාස දින සැමරුම නවීන තාක්ෂණ ශිල්ප ක්‍රම නව ප්‍රවේශයන් කර ගනිමින් අපද්‍රව්‍ය ධනය කර ගැනීම ("Frontier Technologies as an innovative tool to transform waste to wealth") යන තේමාව අනුව යමින් බත්තරමුල්ල පැලවත්ත අපේගම පරිශ්‍රයේ "ජනකලා රඟහලේ" දී ප්‍රධාන උත්සවය පවත්වන ලදී.

ඊට සමගාමීව 2019.10.01 සිට 2019.10.07 දින දක්වා වූ ජනාවාස සතිය තුළ දී කසළ භාවිතයෙන් සිදුකළ හැකි නව නිර්මාණ ප්‍රවර්ධනය හා ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මූලික ප්‍රවේශයක් ගැනීම, ළමා චිත්‍ර හා රචනා තරඟ, ව්‍යවසාය ප්‍රවර්ධන වැඩසටහන්,ලෝක ජනාවාස දින සමරු කලාපය සකස් කිරීම, කසළ කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම හා සහාධිපත්‍ය කළමනාකරණ සංස්ථා පිහිටුවීම, ප්‍රජා ජනාවාස කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම, ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පත් කිරීම හා ජනතා අයිතියට පත් කරන ලද ආදර්ශ ගම්මාන වල සංවර්ධන කටයුතු, ගොඩනැගිලි ඉදිකිරීමේ දී ඇති වන ගැටලු පිළිබඳ උපදේශනය ( Building Clinic) , "සත්‍යාක්ෂණය" ගුවන්විදුලි වැඩසටහන ක්‍රියාත්මක කිරීම, සම්පත් පියස ව්‍යාපෘති භාරදීම, ආදර්ශ ගම්මානවල ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ජනාධිපති කාර්ය සාධන බලකාය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන රුක් රෝපණ, පරිසර සංරක්ෂණ, මත්ද්‍රව්‍ය නිවාරණ හා ආහාර සුරක්ෂිතතාව ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කාලීන වකුගඩු රෝගයෙන් පෙලෙන්නන් සඳහා සිදුකරන නිවාස වැඩසටහන ඇතුළුව විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

❖ **ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.**

දිවයින පුරා පිහිටි ග්‍රාම නිලධාරි වසම් 14023 න් 2019 වර්ෂය අවසාන වන විට ග්‍රාම නිලධාරි වසම් 11192 ක ගැමි නිවාස කමිටු ස්ථාපිත කර ඇත.

ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් ඔබ්බට ගොස් කමිටුවල ක්‍රියාත්මක පරාසය පුළුල් කරනු වස් ගැමි නිවාස කමිටු ප්‍රජා ජනාවාස කමිටු වශයෙන් නම් කිරීම මෙන්ම දිවයිනේ සෑම අනුගම්මානයකටම එක් කමිටුවක් බැගින් ස්ථාපනය කිරීම.

❖ **තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ තොරතුරු ලබා දීම**

2016 අංක 12 දරණ උක්ත පනත ප්‍රකාරව අමාත්‍යාංශය වෙත ලැබී තිබූ අයදුම්පත් සංඛ්‍යාව විසි හතරක් (24) වේ. ඉන් අයදුම්පත් දෙකක් (02) මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවූ බැවින් අදාළ ආයතන වෙත යොමු කර ඇති අතර අනෙක් අයදුම්පත් වලට අදාළ තොරතුරු අමාත්‍යාංශය විසින් හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වෙතින් ලබා ගෙන අදාළ පුද්ගලයන් වෙත ලබා දී ඇත.

❖ **සෙවණ අරමුදල**

සෙවණ ආධාර ලබාදීමේදී අදාළ ආධාරලාභීන් පිළිබඳ හා ව්‍යාපෘති යෝජනා මූලික ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ජා.නි.සං.අධිකාරියේ නිර්දේශ සහිතව, සෙවණ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු , එම ඉල්ලීම් සභාපති ඇතුළු සෙවණ පාලක මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් අනතුරුව ගරු ඇමතිතුමාගේ අනුමැතියට යොමු කර ඇති අතර එහිදී වැඩසටහන් 04 ක් සඳහා ප්‍රතිලාභීන් 5708 ක් සඳහා රු.මි.579.192 ක මුදලක් අනුමත කර ඇති අතර 2019-12-31 දින වන විට රු.මි.374.547 ක මුදලක් නිදහස් කර ඇත.

තවද සෙවණ ලොතරැයි දිනුම් ඇදීමෙන් ජයග්‍රාහකයින් සඳහා සුපිරි ත්‍යාග ලෙස නිවාස 03 පිරිනැමීමට තීරණය කර ඇත.

❖ **මධ්‍යම පාන්තික නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය**

මධ්‍ය ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන කඩිනම් වැඩසටහනෙහි සම්බන්ධීකරණ ඒකකය සමඟින් අදාළ සම්බන්ධීකරණ කාර්ය සිදුකිරීම.

මේ වන විට ව්‍යාපෘති 02 ක් ජනතා අයිතියට පත් කර ඇත.

- අතුරුගිරිය- ග්‍රීන්වැලි
- හෝමාගම - මවුන්ට් ක්ලිෆර්ඩ්

මේ වන විට වැඩ ව්‍යාපෘති 02 ක වැඩ ආරම්භ කර ඇත.

- වාද්දුව - සීබ්‍රීස්
- රාගම - ලාවානාහා හයිට්ස්

## 2.4 - තාක්ෂණ අංශය

2019.06.19 ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සටහනට අදාලව ලබාදුන් තීරණ පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර සංශෝධිත පනත සඳහා නිරීක්ෂණ නැවත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර සංශෝධිත පනත සඳහා නිරීක්ෂණ නැවත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමට අදාලව නියෝග 10 ක් සහ රීති 04 ක් ගැසට් කර ඇත. තවද නියෝග 05 ක් සහ රීති 02 ක් ගරු අමත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති අතර නියෝග 01 ක් සහ රීති 03 ක් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලයට අදාළව පාර්ලිමේන්තුව මගින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලද පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව හා එක්ව අදාළ ආයතනයන්හි නිරීක්ෂණ සලකමින් සකස් කර, ව්‍යවස්ථානුකූලභාවය නීතිපති දෙපාර්තමේන්තුවෙන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව වෙත යොමු කරන ලදි. මේ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පතට අදාලව අප අමාත්‍යාංශයෙන් නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලදි.

අමාත්‍යාංශයට අනුබද්ධිත ඉදිකිරීම් කර්මාන්තයට අදාල ආයතන වන කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවෙහි කටයුතු සඳහා සහයෝගය සම්බන්ධිකරණය හා තාක්ෂණික මග පෙන්වීම සිදු කරනු ලබයි. ඒ අනුව සියළුම ආයතන සම්බන්ධයෙන් වෙන වෙනම පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව 23 ක් වන අතර ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව 09 කි.

## 2.5- ඉදිකිරීම් අංශය

මූලික වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව , රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව , ජාතික යන්ත්‍රෝපකරණ ආයතන මඟින් සිදු කරනු ලබන ඉදිකිරීම් කටයුතු අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණ කිරීම, මෙම අංශය වෙත පැවරුණු ප්‍රධාන කාර්ය භාරය වේ.

ඉදිකිරීම්, අදාළ ආයතනය මගින් ක්‍රියාත්මක කිරීමේදී එම කටයුත්ත සඳහා අමාත්‍යාංශ මට්ටමින් සහයෝගය ලබා දී ඇති අතර එම ඉදිකිරීම් රටට වැඩදායි හා එම ආයතන වල අභිවෘධිය ද ඇති වන පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් මෙන්ම අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සඳහා මැදිහත් වීමද ඉටු කරනු ලබයි.

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන -2019 යටතේ හම්බන්තොට සූරියවැව ජාතික පාසල සඳහා යෝජිත පිහිනුම් තටාකයේ ඉදිකිරීම, දෙබරවැව ජාතික පාසලේ දරු දැරියන් වෙනුවෙන් පිහිනුම් තටාකයක් ඉදිකිරීම හා තිස්සමහාරාම යොවුන් නිකේතන මධ්‍යස්ථානය ඉදි කිරීම, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ජාතික යන්ත්‍රෝපකරණ ආයතන මඟින් ඉටු කිරීම

තවද අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 2019 යෝජනා අංක (44) යටතේ බස් නැවතුම්පල හා දුම්රිය ස්ථාන 16ක සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව මගින් සිදු කිරීම ද

2019 වර්ෂයේ මෙම අංශයේ සෘජු මඟ පෙන්වීම මඟින් සිදු කල මහඟු සංවර්ධන කාර්යයන් වේ.

## 2.6 - නාගරික ජනාවාස අංශය

ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශයන්හි වාසය කරනු ලබන අඩු හා මධ්‍ය ආදායම් ලාභී ජනතාවට අවශ්‍ය පරිදි පදිංචි වීමට හැකියාව

පවතින, පහසුකම් වලින් සමන්විත නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් මෙහෙයවීම හා නාගරික ජනාවාස සංවර්ධනය කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

නාගරික ජනාවාස ව්‍යපෘති හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා තාක්ෂණික මඟපෙන්වීම මෙන්ම නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සිදු කිරීම ප්‍රධාන කාර්යභාරය වේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද නිවාස යෝජනා ක්‍රම සඳහා තාක්ෂණික කටයුතු හා සම්බන්ධීකරණය සඳහා රැස්වීම් පැවැත්වීම, මධ්‍ය ආදායම් කඩිනම් නිවාස වැඩසටහන සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නාගරික නිවාස ව්‍යාපෘති වල තාක්ෂණික කටයුතු වලදී අමාත්‍යාංශයට අදාල කටයුතු සම්බන්ධීකරණය ද මෙම අංශය මගින් සිදු කරයි.

එමෙන්ම මෙම අමාත්‍යාංශයට අයත් ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා ස්ථාවර ව්‍යාපෘති ඇගයීම් කමිටුව වෙත යොමු කර එහි නිර්දේශ අනුව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යැවීම සඳහා සැලසුම් අංශය වෙත යොමු කිරීමද මෙම අංශය මගින් සිදු කරයි. 2019 වසරේදී මෙලෙස ව්‍යාපෘති යෝජනා 7 ක් නිර්දේශ කර ඉදිරිපත් කරන ලදි.

## 2.7- ඉංජිනේරු සේවා අංශය

අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ප්‍රදානය කරනු ලබන ඉදිකිරීම් කොන්ත්‍රාත් වලට අදාල මිලගණන් ඇගයීම අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර ඇති ස්ථාවර තාක්සණික කමිටුව (STC) විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව 2019-12-31 දිනට ව්‍යාපෘති 122 ක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් සඳහා කමිටුවේ සුපරීක්ෂණය යටතේ අනුමැතිය ලබා දී ඇත. එහිදී අදාල ආයතනය විසින් ඉල්ලුම් කරන ලද රු.මි.7,478.16 කට එදිරිව රු.මි.6,615.92 ක් සඳහා අනුමැතිය ලබාදෙමින් රජය වෙත ඉතිරි කළ මුදල් රු.මි.862.23 කි.
ව්‍යාපෘති කොන්ත්‍රාත් කාර්යයන් 05 කට අදාල අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙන්ම අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටු (MPC) විසින් අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 02 කි.

දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා ඉංජිනේරු සේවා අතර, අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව (MPC) සඳහා අදාල ව්‍යාපෘති 01 ක් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සඳහා අදාල වන ව්‍යාපෘති 01 ක් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය සහිතව පත්කල සාකච්ඡා සම්මුති කමිටු (CANC) සඳහා අදාල කොන්ත්‍රාත් 03 ක් සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වන කොන්ත්‍රාත් 01 ක් ආදී වශයෙන් එකතුව කොන්ත්‍රාත් 05 ක් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

## 2.8 - මූල්‍ය අංශය

2019 වසර සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු දැනටත් සිදුකරමින් පවතී.

2019 වර්ෂය තුලදී රජයේ විගණන අංශයෙන් විගණන විමසීම් 28 ක් ලැබී ඇති අතර ඉන් විමසීම් 08 කට පිළිතුරු යවා ඇත.

## 2.9 - ජාතික නිවාස කොමසාරිස් අංශය

1973 අංක 1 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ රජයට පවරාගත් නිවාස වල කුලී නිවැසියන්ට ඔප්පු ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂයේ ඔප්පු 12 ක් ලබා දී ඇත. ස්ථාන පරීක්ෂණ 26 ක් පවත්වා ඇත.

රජයට පවරාගත් නිවාස වල අයිතිකරුවන්ට වන්දි ලබාදීම් විශාල ප්‍රමාණයක් අවසන් කර ඇත.

යම් යම් නිවාස දේපල සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු වලදී පාර්ශවයන් අදාල

ලේඛන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම, ප්‍රාදේශිය ලේකම් වාර්තා ප්‍රමාද වීම, ලේඛන, ගැසට්පත්‍ර සහ පිඹුරු ආදිය නොමැති වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කිරීමට නොහැකි වීම මෙන්ම තක්සේරු මණ්ඩල මේ දක්වා සංස්ථාපනය නොවීම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අභියෝගයක් වූ අතර පූර්ව ජාතික නිවාස කොමසාරිස්ගේ කාලසීමාව අවසන්වීමෙන් පසු ස්ථිර ජාතික නිවාස කොමසාරිස් වරයකු මෙතෙක් පත් නොකිරීම ද තවත් හේතුවක් විය.

## 2.10 - අභ්‍යන්තර විගණන අංශය

2019 වර්ෂයෙහි විගණන වාර්තා 06 ක කටයුතු අවසන් කර ඇත. 2019-12-10 වන විට විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4 න් 3 ක් පවත්වා ඇත. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි විමර්ශණ 04 ක් අවසන් කර ඇති අතර විමර්ශණ 03 ක කටයුතු සිදුකරමින් පවතී.

අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල විගණන කටයුතු සම්බන්ධිකරණයක් ඇතිකිරීම මෙන්ම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මගින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන වල ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබේ.

විමර්ශන කටයුතු මෙහෙයවීමට හා විගණන කටයුතු සම්බන්ධයෙන් පළපුරුදු කාර්යය මණ්ඩලයක් නොමැති වීමෙන් අංශයෙහි රාජකාරි කටයුතු සිදු කිරීමේදී ගැටලු සහගත බවක් ඇති වේ.

## 2020 - ඉදිරි දැක්ම

### නිවාස අංශය

- ❖ හරිත සහ සුහුරු නගර සහ වාසස්ථාන බිහිකිරීම
- ❖ සෑම පවුලකටම ප්‍රමාණවත් නිවසක් සහතික කිරීම
- ❖ ආන්තික කණ්ඩායම් සහ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා නිවාස හා අනෙකුත් අත්‍යවශ්‍ය පහසුකම් වෙත ප්‍රවේශය සහතික කිරීම
- ❖ නිවාස සංවර්ධනය සඳහා බහු-පාර්ශ්ව හවුල්කාරිත්වය දිරිමත් කිරීම
- ❖ නිවාස හරහා ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා දළ දේශීය නිෂ්පාදිතයෙන් 12% ක් දක්වා නිවාස මූල්‍ය වෙළඳපොල සහතික කිරීම
- ❖ නිවාස අංශයට අදාල ප්‍රතිපත්ති සහ නෛතික රාමුව සවිමත් කිරීම
- ❖ සියලුම නාගරික ප්‍රදේශවල තුලී නිවාස ප්‍රමාණවත් ලෙස සැපයීම සහතික කිරීම

### ඉදිකිරීම් අංශය

- ❖ ඉදිකිරීම් කර්මාන්තය සඳහා බලගතු ප්‍රතිපත්ති සහ නෛතික රාමුවක්
- ❖ වාණිජ, රාජ්‍ය හා සේවා ක්ෂේත්‍රයන්හි ඉදිකිරීම් ක්‍රියාවලින් සහ නිර්මිත පරිසරය තුල සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම
- ❖ ජාතික ආර්ථිකයට ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රශස්ත දායකත්වය සහතික කිරීම.
- ❖ ඉදිකිරීම් කර්මාන්තයේ විවිධ අංශවල දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ හොඳින් වර්ධනය වූ ධාරිතාව
- ❖ රටේ ඉදිකිරීම් පිරිවැය දකුණු ආසියානු කලාපයේ තරඟකාරී අනුපාතයට පහලට ගෙන ඒම
- ❖ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනයේ ප්‍රධාන ධාරාවේ තිරසාර බව සහතික කිරීම

..........................................................................................

ප්‍ර.ග.නි./ ග.නි./ආයතන ප්‍රධානියා විසින් අත්සන් කළ යුතුය.

# පරිච්ඡේදය 3

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**(නිවාස හා ඉදිකිරීම් අංශය)**

ඒසීඒ -එෆ්

**2019-12-31දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන**
**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

| | | | තතය | රු. | |
|---|---|---|---|---|---|
| අයවැය (වර්තමාන වර්ෂය) | | සටහන | වර්තමාන වර්ෂය | ඉකුත් වර්ෂය | |
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 1 | - | - | |
| - | අන්තර්ජාතික වෙළදාම මත බදු | 2 | - | - | |
| - | බදු නොවන ආදායම් සහ | 3 | - | - | |
| - | වෙනත් | 4 | - | - | ACA - 1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| | | | | | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 12,701,854,000 | 9,261,908,000 | |
| | භාණ්ඩාගාර අග්‍රිම (ආපසු යැවීම්) | | | (75,000,000) | ACA – 3 |
| - | තැන්පතු | | 3,069,224 | 2,864,014 | ACA - 4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,755,070 | 10,013,128 | ACA - 5/5 (a) |
| - | වෙනත් ලැබීම් | | 88,301,357 | 25,544,280 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **12,805,979,651** | 9,225,329,422 | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **12,805,979,651** | 9,225,329,422 | |
| | | | | | |
| | අඩුකලා - වියදම | | | | |
| - | පුනරාවර්තන වියදම | | - | - | |
| 348,100,000 | වේතන,වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ | 5 | 109,537,546 | 107,509,811 | ACA – 2 (ii) |
| 123,600,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 780,320,035 | 113,654,299 | |
| 6,300,000 | ප්‍රධාන සහ මාරුකිරීම් | 7 | 228,212,844 | 196,751,032 | |
| - | පොලී ගෙවීම් වෙනත් පුනරාවර්තන | 8 | - | - | |
| - | වියදම් | 9 | - | - | |
| **478,000,000** | මුළු පුනරාවර්තන වියදම් (ඇ) | | **1,118,070,425** | **417,915,142** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන වියදම් හා මූලධන වත්කම් | | | | |
| 5,000,000 | පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10 | 4,045,890 | 3,489,580 | |
| 106,000,000 | මූලධන වත්කම් අත්පත්කර ගැනීම | 11 | 168,454,677 | 13,466,505 | |
| | | | | | ACA – 2 (ii) |
| 10,635,000,000 | ප්‍රාග්ධන පැවරීම් | 12 | 11,127,573,249 | 8,785,426,680 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| | | | | | |
| 1,000,000 | හැකියා වර්ධනය | 14 | 903,033 | 970,311 | |
| 558,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 396,015,899 | 422,492,887 | |
| **11,305,000,000** | මුළු මූලධන වියදම් **(ඉ)** | | **11,696,992,748** | **9,225,845,963** | |
| | ප්‍රධාන ලෙජර් වියදම් **(ඊ)** | | 0 | 0 | |
| | තැන්පතු ගෙවීම් | | 2,822,542 | 3,039,664 | ACA-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 12,404,443 | 12,220,530 | 5/5(a) |
| | **මුළු වියදම උ** | | **15,226,985** | **15,260,194** | |
| | =(ඇ+ඉ+ඊ) | | **12,830,290,158** | **9,659,021,299** | |
| 11,783,000,000 | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ** ඌ=(ඇ-උ) | | **(24,310,507)** | **(433,691,877)** | |

# 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

## 2019 දෙසැම්බර් 31 දිනට

| | සටහන | තත්‍ය<br>වර්තමාන වර්ෂය<br>2019<br>රු. | ඉකුත් වර්ෂය<br>2018<br>රු. |
|---|---|---|---|
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ,පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 279,640,560 | 276,442,221 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 25,863,254 | 26,213,881 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | | |
| **මුළු වත්කම්** | | **305,503,814** | **302,656,102** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 25,616,572 | 26,213,881 |
| දේපළ,පිරියත හා උපකරණ සංචිතය | | 279,640,560 | 276,442,221 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ – 5(ආ) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ– 4 | **246,682** | **0** |
| අග්‍රිම ශේෂය | ඒසීඒ – 3 | | |
| | | 305,503,814 | 302,656,102 |

**මුළු වගකීම්**

පිටු අංක ............... සිට ................ දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ........... සිට ........ දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| ................................ | .................... | ........................................................ |
|---|---|---|
| ප්‍රධාන ගණන් දීමේ නිලධාරි<br>නම | ගණන්දීමේ නිලධාරි<br>නම | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/<br>අධ්‍යක්ෂ(මූල්‍ය) /කොමසාරිස් (මූල්‍ය) |
| තනතුර | තනතුර | නම |
| දිනය | දිනය | දිනය |

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| | වර්තමාන වර්ෂය<br>රු | තත්‍ය<br>ඉකුත් වර්ෂය<br>රු |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | - | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර,දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 12,790,155,357 | 9,300,329,442 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ) | 12,790,155,357 | 9,300,329,442 |
| <u>අඩු කළ - මුදල් වැය කිරීම්</u> | | |
| මෙහෙයුම් වියදම් | 817,386,813 | 221,164,110 |
| පුද්ගල පඩි නඩි | 5,312,844 | 196,751,032 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 375,682,281 | |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 75,000,000 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන මුදල් ප්‍රවාහය (ආ) | **1,198,381,937** | **492,915,142** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් (ඇ)=(අ)- (ආ)** | **11,591,773,41** | **8,807,414,300** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අය කර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 1,291,203 | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)** | 1,291,203 | |

| | | |
|---|---|---|
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් | | |
| ආයෝජන අත්පත්කර ගැනීම් | 11,583,522,145 | 9,225,845,963 |
| අත්තිකාරම් ගෙවීම් | 9,542,477 | - |
| ආයෝජන ක්‍රියාකාරම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | **11,593,064,622** | **9,225,845,963** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(11,591,773,419)** | **(9,225,845,963)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)-(ඊ)** | **(0)** | **(418,431,663)** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | **-** | **-** |
| දේශීය ණය ගැනීම් | | |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 2822542 | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | **2822542** | **-** |
| <u>**අඩු කළා - මුදල් වැය කිරීම් (for):**</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | **2,822,542** | |
| මූල්‍ය ක්‍රියාකරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **2,822,542** | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(0)** | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) –(ඒ)** | **2,822,542** | **(418,431,663)** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **(0)** | |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

## 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| | නැත | | | | |

## 3.5 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 478,000,000 | 1,142,000,000 | 1,118,070,426 | 98 |
| ප්‍රාග්ධන | 11,305,000,000 | 12,365,000,000 | 11,696,992,748 | 95 |

**3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

**රු,000**

| අ.අ | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගිකර ගන්නා ලද ප්‍රතිපාදන,ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 1. පුහුණු උපාධිධාරීන් බඳවා ගැනීම<br>2. ගොඩනැගිලි ව්‍යාපෘති ඉදිකිරීම ( Nemo ආයතනය මගින්) | | | 374,216,395 | |
| | ජනාධිපති කාර්යාලය | පරිසර සංරක්ෂණ වැඩසටහන | | | 2,226,155 | |
| | විශ්‍රාම වැටුප් දෙ.මේ. | | | | 640,154 | |

**3.7** **මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය **31.12.2019** | දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය **31.12.2019** | ඉදිරියේදි ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | | | 150,000,000 | |
| 9152 | යන්ත්‍රෝපකරණ | | | 2,861,349 | |
| 9153 | ඉඩම් | | | නැත | |
| 9154 | Intangible වත්කම් | | | නැත | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | | නැත | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | | නැත | |
| 9180 | බදු දෙන ලද වත්කම් | | | නැත | |

## 3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී ,විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

# පරිච්ඡේදය 4
## කාර්ය සාධන දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%)ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| අඩු ආදායම් ලාභීන් සඳහා නිවාස ඉදිකිරීම යටතේ නිවාස ඒකක 31712 ක වැඩ ආරම්භ කොට නිවාස ඒකක 12000 ක වැඩ අවසන් කිරීම | | | ✓ |
| අර්ධ වශයෙන් නිමකල නිවාස 5000 ක වැඩ නිම කිරීම සහ 2018 වර්ෂයේ ආරම්භ කල අවිච්ඡේද කාර්යයන් 19006 ක වැඩ අවසන් කිරීම | | | ✓ |
| උතුරු හා නැගෙනහිර පළාත් වල අවතැන් වූ පවුල් සඳහා නිවාස ලබාදීම යටතේ පවුල් 9523 ක නිවාස අළුතින් ආරම්භ කොට ඉන් 8635 ක වැඩ අවසන් කිරීම | | ✓ | |
| පැරණි මහල් නිවාස යෝජනා ක්‍රම 28 ක් ප්‍රතිසංස්කරණය කිරීම | | | |
| ජනාවාස ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පාලම් 27 ක ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සහ ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති 16 ක සංවර්ධන කටයුතු සිදු කිරීම | | | |
| සම්පත් පියස සණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක 30 ක් ඉදිකිරීම | ✓ | | |
| අඩු ආදායම්ලාභී ජනාවාස ආශ්‍රිත පවුල් 6663 ක මානව සංවර්ධනය සඳහා මූලික කටයුතු සිදු කිරීම | ✓ | | |
| ඉදිකිරීම් කර්මාන්තයේ නවක ශිල්පීන් 7800 ක් පුහුණු කර ක්ෂේත්‍රයට මුදාහැරීම | | ✓ | |
| ජගත් ජනාවාස දින වැඩසටහන සංවිධානය කිරීම | | ✓ | |
| මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් 12 පැවැත්වීම | | ✓ | |
| විගණන කළමනාකරණ කමිටු 04 ක් පැවැත්වීම | ✓ | | |

සැ.යු- අමාත්‍යාංශයට අනුබද්ධිත සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන වැඩසටහන් ආශ්‍රිත දර්ශක ඒ ඒ ආයතනය විසින් වෙන වෙනම ඉදිරිපත් කරන කාර්ය සාධන වාර්තා වල ඉදිරිපත් කර ඇත.

# පරිච්ඡේදය 5
## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

**5.1** හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% 49% | 50%-74% | 75%100% |
| අමාත්‍යාංශය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම සකස් කොට අනුමැතියට ඉදිරිපත් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම | | * (දැනට ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කරමින් පවතී) | |
| අමාත්‍යාංශය සඳහා තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම සකස් කොට අනුමැතියට ඉදිරිපත් කිරීම | තිරසර සංවර්ධන සැලැස්ම | | * (දැනට ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කරමින් පවතී) | |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණය හා අභියෝග සැකෙවින්**

තිරසර සංවර්ධන සැලැස්ම සකස් කිරීම අනුබද්ධයෙන් ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගන්නා විෂය ක්ෂේත්‍ර 6 ක්, ඉලක්ක 16 ක්, සහ උපායමාර්ග 110 ක් හඳුනාගෙන ඇත. නිවාස අංශයට අදාලව ව්‍යාපෘති හා වැඩසටහන්ද ඇතුලත්ව ක්‍රියාත්මක සැලැස්ම සම්පූර්ණ කර ඇතත් ඉදිකිරීම් අංශයට අදාලව එම කොටස පමණක් සම්පූර්ණ කිරීමට ඇත. ඉදිකිරීම් අංශයට අදාල ක්‍රියාත්මක සැලැස්ම සම්පූර්ණ කල වහාම නිරීක්ෂණ සහ උපදෙස් සඳහා තිරසර සංවර්ධන ජාතික සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

# පරිච්ඡේදය 6
## මානව සම්පත් පැතිකඩ

**06.1** සේවක සංඛ්‍යා කළමනාකරණ **31.12.2019**

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | සේවක සංඛ්‍යා හිඟය/ අතිරික්තය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 23 | 08 |
| තෘතීය මට්ටම | 06 | 02 | 04 |
| ද්විතීයික මට්ටම | 108 | 81 | 27 |
| ප්‍රාථමික මට්ටම | 53 | 40 | 13 |
| **එකතුව** | **198** | **146** | **52** |

**06.2 ****ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

2017/04/12 සහ 12/15/42/504 / 142- viii යන කැබිනට් තීන්දුවට අනුව මෙම අමාත්‍යාංශය සඳහා විශේෂ ශ්‍රේණියේ තනතුරු දෙකක් අනුමත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සහ ශ්‍රී ලංකා සැලසුම් සේවා (විශේෂ ශ්‍රේණියේ) නිලධාරීන් 2019 වර්ෂයේදී පත් කර ඇත. මේ සමඟ අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලය 198 දක්වා ඉහළ ගොස් තිබේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ඉහත පත්වීමට අදාළව, අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ), තනතුර වෙනුවට අධ්‍යක්ෂ (ඉදිකිරීම්) හා අධ්‍යක්ෂ (තාක්ෂණ) ලෙසද සහකාර අධ්‍යක්ෂ (ඉදි.තාක්ෂණ) වෙනුවට සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම්) හා සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණ) ලෙසද නව තනතුරු අනුමත කර ගැනීමට නියමිතය.

මීට අමතරව, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අලුතින් බඳවා ගැනීම වසර දෙකකට ආසන්න කාලයක් පුරප්පාඩු වී ඇති ගණකාධිකාරී තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීමට සමත් වී තිබේ. ද්විතීයික මට්ටමේ පුරප්පාඩු පිළිබඳ පුහුණුව සඳහා උපාධිධාරී අභ්‍යාසලාභීන් 07 දෙනෙකු අමාත්‍යාංශයට බඳවා ගැනීමෙන් කාර්ය මණ්ඩල අවශ්‍යතා කළමනාකරණය කරන ලදී. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව 2019 දී කාර්යාල සහායකයින් දෙදෙනෙකු බඳවා ගන්නා ලදී. 2011.12.31 වන විට අමාත්‍යාංශයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 52 කි.

## 06.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | සමස්ථ ආයෝජනය (**Rs'000**) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය සේවා විනය ක්‍රියා පටිපාටිය | 6 | 1 දවස් | නොමිලේ | | දේශීය | |
| රාජ්‍ය අංශය සඳහා ආචාර ධර්ම, සාරධර්ම සහ ප්‍රමිතීන් | 7 | 1 දවස් | නොමිලේ | | දේශීය | |
| නව විගණන පනත | 20 | 1 දවස් | නොමිලේ | | දේශීය | |
| රජයේ සේවා නිලධාරීන් සඳහා "බී" ගිණුම සකස් කිරීම | 2 | 1 දවස් | Rs. 10,000/= | | දේශීය | |
| ආතතියෙන් තොර සේවකයෙකු පිළිබඳ දේශනය | 4 | 1 දවස් | නොමිලේ | | දේශීය | |
| මයික්‍රොසොෆ්ට් කාර්යාල විශේෂ පුහුණුව | 3 | 8 දවස් | නොමිලේ | | දේශීය | |
| නිල බැංකු ගිණුම් සහ චෙක්පත් | 1 | 1 දවස් | Rs.7000/= | | දේශීය | |
| ඊ-කේතය සහ මූල්‍ය රෙගුලාසි | 2 | 2 දවස් | Rs.17,000/= | | දේශීය | |
| ගබඩා කළමනාකරණය | 1 | 1 දවස් | Rs.3000/= | | දේශීය | |
| රාජ්‍ය අංශයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන | 2 | 1 දවස් | නොමිලේ | | දේශීය | |
| වැටුප් හා වැටුප් සංශෝධනය සකස් කිරීම | 4 | 2 දවස් | Rs.30,000/= | | දේශීය | |
| ප්‍රවාහන කළමනාකරණය | 1 | 2 දවස් | Rs.7000/= | | දේශීය | |
| PSC රීති | 6 | 1 දවස් | free | | දේශීය | |
| පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම | 1 | 2 දවස් | Rs.8500/= | | දේශීය | |
| විශ්‍රාම වැටුප සකස් කිරීම | 1 | 1 දවස් | Rs.5000/= | | දේශීය | |
| ඊ කේතය | 2 | 2 දවස් | Rs.17,000/= | | දේශීය | |
| SOR පුහුණුව | 3 | 2 දවස් | Rs.25,500/= | | දේශීය | |
| විදේශ නිවාඩු සහ විදේශ පුහුණුව සඳහා දීමනා | 2 | 1 දවස් | Rs.10,000/= | | දේශීය | |
| ඊ කේතය | 4 | 2 දවස් | free | | දේශීය | |
| KKS පුහුණුව | 2 | 2 දවස් | Rs.17,000/= | | දේශීය | |
| KKS පුහුණුව | 3 | 1 දවස් | Rs.12,000/= | | දේශීය | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| "ගැඹුරු බිම් මහල සැලසුම් කිරීම සහ ඉදිකිරීම" පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 1 දවස් | Rs.13,500/= | | දේශීය | |
| කොන්ක්‍රීට් සහ වානේවල දියුණුව පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 1 දවස් | Rs.13,500/= | | දේශීය | |
| ව්‍යුහාත්මක ශක්තිමත් කරන ලද කොන්ක්‍රීට් පිළිබඳ සම්මන්ත්‍රණය | 2 | 1 දවස් | Rs.8000/= | | දේශීය | |
| කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨ මාලාව | 1 | 40 දවස් | Rs.100,000/= | | දේශීය | |
| ව්‍යවහාරික අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | 1 | 8 දවස් | Rs.234,500/= & US $ 1104 | | විදේශ | |
| නිවාස හා ජනාවාස සංවර්ධන වැඩසටහනේ ධාරිතා වර්ධනය | 4 | 15 දවස් | 225 Pounds + US $ 2400 | | විදේශ | |
| එක්සත් ජාතීන්ගේ ජනාවාස සමුළුවේ පළමු සැසිය | 1 | 5 දවස් | Rs.181,500/= +US $ 4395 | | විදේශ | |
| ධාරිතා වර්ධන පුහුණුව | 1 | 7 දවස් | US $ 280 | | විදේශ | |
| සාමූහික සමිති පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | 1 | | | | විදේශ | |
| ශ්‍රී ලංකාව සඳහා යටිතල පහසුකම් සැලසුම් කිරීම හා ඉදිකිරීම පිළිබඳ 2019 සම්මන්ත්‍රණය | 2 | 20 දවස් | US $ 1760 | | විදේශ | |
| BRCA වැඩමුළුව | 1 | 1 දවස් | | | විදේශ | |
| ශ්‍රී ලංකාව සඳහා පටි සහ මාර්ග සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 3 | 22 දවස් | US $ 2640 | | විදේශ | |
| රුකියා ලෝකයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු | 1 | 19 දවස් | US $ 840 + 75 Pounds | | විදේශ | |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණ ප්‍රවේශයන් සහ උපාය මාර්ග | 1 | 45 දවස් | US $ 1200 | | විදේශ | |

# පරිච්ඡේදය 7
## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීමට අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව , රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරියන්ගේ පාලනය යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව , වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ (කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත) | 4 වන කාර්තුවේ කමිටු රැස්වීම 2020-03-05 දින පැවැත්වීමට නියමිතව ඇත | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| | සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 ට අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළකර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල්කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූලවීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතුකර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදී තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරිම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබිම | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | අදාල නොවේ | |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත තාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබිම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබාදිම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දි තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබිම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබිම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරිම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතිය පදනම්කර ගෙන සමස්ත කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |